FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

# 2022 අගෝස්තු

2 වන වෙළුම - කලාප අංක 8



ප්‍රාසාංගික කලාකරු ශාලික රුක්ෂාන් අත්අඩංගුවට



සමාජ මාධ්‍ය ක්‍රියාකාරිනිය පිටුවහල් කරයි



වසන්ත මුදලිගේ ඇතුළු තිදෙනෙකුට රැඳවුම් නියෝග

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 36ක් 2022 අගෝස්තු මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 05ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 28ක්, වෘත්තීයවේදීත්වයට අදාළ සිදුවීම් 01ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 02ක් ඒ අතර වෙයි. අදහස් පළ කිරීමේ නිදහසෙහි ප්‍රකාශනයක් වූ උද්ඝෝෂණවල නිරත වීම හේතු කොටගෙන, විවිධ චෝදනා මත ක්‍රියාකාරිකයන් අත්අඩංගුවට ගැනීම අගෝස්තු මාසය තුළදී රැල්ලක ආකාරයෙන් ඉස්මතු වූ අතර මෙම වාර්තාවේ අන්තර්ගත වන්නේ ඒ අතරින් පැහැදිලි තොරතුරු සපයාගත හැකි වූ සිදුවීම් සීමිත ප්‍රමාණයක් පමණි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. කවියකු හා වෘත්තියෙන් ගුරුවරයකු වූ අහ්නාෆ් ජසීම්, ත්‍රස්ත ක්‍රියාකාරකම් සඳහා නම් කළ පුද්ගලයකු වශයෙන් ලැයිස්තුගත කිරීම.
2. ගෝල්ෆේස් අරගලයට (GGG) සම්බන්ධ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ විමුක්ති රණසිංහ අත්අඩංගුවට ගැනීම.
3. ගෝල්ෆේස් අරගලයට සම්බන්ධ ක්‍රියාකාරිකයකු වූ සිතුම් වසන්ත ජයකොඩි අත්අඩංගුවට ගැනීම.
4. ප්‍රමුඛ වෘත්තීය සමිති නායකයකු හා මානව හිමිකම් ආරක්ෂකයකු වූ ජෝසප් ස්ටාලින් අත්අඩංගුවට ගැනීම.
5. මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදරට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට කරුණු වාර්තා කිරීම.
6. ජනාධිපතිවරයා විසින් පනවා ඇති හදිසි නීති රෙගුලාසිවලට එරෙහිව ලිබරල් තරුණ ව්‍යාපාරය මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.

7. ජාතික භික්ෂු පෙරමුණේ මාධ්‍ය ලේකම්, කොස්වත්තේ මහානාම හිමි අත්අඩංගුවට ගැනීම.

8. ගෝල්ෆේස් අරගල භූමියේ රැඳී සිටින සියලු දෙනාට ඉන් ඉවත් වන ලෙස කොටුව පොලිසියේ ස්ථානාධිපතිවරයා දැනුම් දීම.

9. ගෝල්ෆේස් අරගලයට සහාය පළ කරමින් සමාජ මාධ්‍ය ඔස්සේ ක්‍රියාකාරී වූ බ්‍රිතාන්‍ය ජාතික තරුණියකගේ වීසා අවලංගු කොට, රටින් පිටුවහල් කිරීම.

10. සිරස මාධ්‍යවේදීන්ට පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමේ නිගමන හා නිර්දේශ ප්‍රකාශයට පත් කිරීම.

11. ජනාධිපතිවරයාට එරෙහි උද්ඝෝෂණයකට සහභාගී වීම හේතුවෙන්, වෘත්තීය සමිති නායකයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම.

12. ජනාධිපති මන්දිරය අසල උද්ඝෝෂණයක නිරත වීම සම්බන්ධයෙන් හිටපු පා.ම. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු පිරිසක් අධිකරණයට ඉදිරිපත් කිරීම.

13. නීතියට පටහැනි ලෙස පොලිස් ඇඳිරිනීතිය පැනවීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.

14. උද්ඝෝෂණයකට අදාළ චෝදනා මත ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු වූ මංගල මද්දුමගේ අත්අඩංගුවට ගැනීම.

15. ගෝල්ෆේස් අරගලයේ තරුණ ක්‍රියාකාරිකයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම.

16. උද්ඝෝෂණයක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝගයක් ඉල්ලා ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සමකට නීතිපතිවරයා විරෝධය පළ කිරීම.

17. සාමකාමී විරෝධතා මර්දනය කිරීම සඳහා හදිසි අවස්ථා රෙගුලාසි යොදා ගැනීම, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශේෂඥයින් හෙළා දැකීම.

18. උද්ඝෝෂණයකට අදාළව සමාජ ක්‍රියාකාරිකයින් 8 දෙනෙකු අධිකරණයට ඉදිරිපත් කිරීම.

19. තර්ජනයක් සම්බන්ධයෙන් කළ පැමිණිල්ලකට අදාළව, මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දීම.

20. උද්ඝෝෂණයක නිරත වූ සිසුන් 19 දෙනෙකු අත්අඩංගුවට ගැනීම හා සිසු නායකයින් තිදෙනෙකුට එරෙහිව රැඳවුම් නියෝග ලබා ගැනීම.

21. පැරිස් නුවර උද්ඝෝෂණවල ක්‍රියාකාරිකයකු වූ අර්ජුන අමදෝරු ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගැනීම.

22. ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ සහජ මධුසංක ගාල්ලේදී අත්අඩංගුවට ගැනීම

23. සමාජ ක්‍රියාකාරික, චින්තක රාජපක්ෂ අත්අඩංගුවට ගැනීම.

24. ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ පියත් නිකේශල අත්අඩංගුවට ගැනීම.

25. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ නායක රංගන ලක්මාල් දේවප්‍රිය අත්අඩංගුවට ගැනීම.

26. ප්‍රවෘත්ති සාකච්ඡාවකට සහභාගි වෙමින් සිටින අතරතුරදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර අත්අඩංගුවට ගැනීමට පොලිසිය උත්සාහ දැරීම.

27. 'අවදානම්සහගත වාර්තාකරණය, ජනමාධ්‍යවේදියෙකුගේ වගකීම, වගවීම සහ සීමා' මැයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විවෘත සංවාදයක් පැවැත්වීම.

28. අරගලයට සම්බන්ධ ප්‍රාසාංගික කලාකරුවකු වන ශාලික රුක්ෂාන් සේනාධීර අත්අඩංගුවට ගැනීම.

29. අරගලයේ ක්‍රියාකාරිකයකු වූ සේනාධි ගුරුගේ අත්අඩංගුවට ගැනීම.

30. ජනාධිපති කාර්යාලයේදී මාධ්‍ය හමුවක් ඇමතීම සම්බන්ධයෙන් ක්‍රියාකාරිකයන් පිරිසක් අධිකරණයට ඉදිරිපත් කිරීම.

31. ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිනිය වූ මේරි සොනාලි පැවිදි සොහොයුරිය අධිකරණයට ඉදිරිපත් කිරීම.

32. උද්ඝෝෂණයකදී ක්‍රියාකාරිකයින් 27 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

33. ආණ්ඩුවට එරෙහි විරෝධතාවල ක්‍රියාකාරිකයකු වූ නීතිඥ ඉන්දික අත්තනායක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.

34. කලා ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිකයකු හා වෘත්තීය නිර්මාණවේදියකු වන සංජය ඈපා සෙනෙවිරත්න අධිකරණයට ඉදිරිපත් කිරීම.

35. විරෝධතාකරුවන්ට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීම ගැන හියුමන් රයිට්ස් වොච් සංවිධානය විරෝධය පළ කිරීම.

36. අධිකරණයට ඉදිරිපත් වූ අරගලයේ ක්‍රියාකාරිකයින් දෙදෙනෙකුට ඇප නියම වීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 අගෝස්තු**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 05 |
| නීතිමය කොන්දේසි | 28 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 02 |
| වෘත්තීයවේදීත්වය | 01 |
| **එකතුව** | **36** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 05ක් අගෝස්තු මාසයේදී නිරීක්ෂණය විය.**

**2 වගුව: 2022 අගෝස්තු: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 05**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මානසික බලපෑම් | 04 |
| නිදහස අහිමි කිරීම | 01 |
| **එකතුව** | **05** |

01. **කවියකු හා වෘත්තියෙන් ගුරුවරයකු වූ අහ්නාෆ් ජසීම්, ත්‍රස්ත ක්‍රියාකාරකම් සඳහා නම් කළ පුද්ගලයකු වශයෙන් ලැයිස්තුගත කිරීම.**

කාව්‍ය කෘතියක් ලියා පළ කිරීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 579ක් රඳවා තැබූ අහ්නාෆ් ජසීම්, අධිකරණය මගින් ඇප මත නිදහස ලබා සිටින අතර, ශ්‍රී ලංකා රජය විසින් අගෝ. 1 වැනිදා ගැසට් කර ඇති 'ත්‍රස්ත ක්‍රියාකාරකම් සඳහා නම් කළ' පුද්ගලයන්ගේ ලැයිස්තුවට ඔහුගේ නමද ඇතුළත් කර තිබේ.

මූලාශ්‍ර: 1. twitter.com 2. www.youtube.com

02. **තර්ජනයක් සම්බන්ධයෙන් කළ පැමිණිල්ලකට අදාළව, මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දීම.**

2021 වසරේ ජුනි මාසයේදී ෆේස්බුක් ඔස්සේ සිදු වූ සංවාදයකදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් විසින් සිදු කළ මරණ තර්ජනයක් සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකට අදාළව ප්‍රකාශයක් ලබාදීම සඳහා මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන, අගෝස්තු 9 වැනිදා කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු මූලස්ථානයේ පෙනී සිටියේය.

මූලාශ්‍රය: twitter.com

03. **ගෝල්ෆේස් අරගලයට සහාය පළ කරමින් සමාජ මාධ්‍ය ඔස්සේ ක්‍රියාකාරී වූ බ්‍රිතාන්‍ය ජාතික තරුණියකගේ වීසා අවලංගු කොට, රටින් පිටුවහල් කිරීම.**

වීසා කොන්දේසි උල්ලංඝනය කිරීමේ චෝදනාව මත ස්කොට්ලන්ත ජාතික කෙලී ෆ්‍රේසර් (Kayleigh Fraser) නැමති ඇයගේ ගමන් බලපත්‍රය අගෝස්තු 3 වැනිදා ආගමන විගමන නිලධාරීන් අත්අඩංගුවට ගත් අතර පසුව, වීසා අවලංගු කොට 15 වැනිදාට පෙර රටින් පිට වන ලෙස නියෝග කරන ලදි. එම තීරණය බල රහිත කරන ලෙස ඉල්ලා ඇය අභියාචනාධිකරණය හමුවේ පෙත්සමක් ගොනු කළද එය විභාගයට නොගෙනම ප්‍රතික්ෂේප කෙරිණි.

මූලාශ්‍රය: www.bbc.com

04. ප්‍රවෘත්ති සාකච්ඡාවකට සහභාගි වෙමින් සිටින අතරතුරදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර අත්අඩංගුවට ගැනීමට පොලිසිය උත්සාහ දැරීම.

විරෝධාකරුවන් මර්දනය කිරීමට එරෙහිව බහුජන සංවිධානවල නියෝජිතයින් අගෝස්තු 23 වැනිදා මරදාන CSR ශාලාවේදී ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමින් සිටින අතරතුර පොලිස් කණ්ඩායම් කිහිපයක් පැමිණ එම ස්ථානය වටලන ලදි. ඔවුන් පැවසුවේ අධිකරණ නියෝගයක් කඩ කිරීමේ චෝදනාව මත එරංග ගුණසේකර අත්අඩංගුවට ගැනීමට නියමිත බවයි. පසුව එම කණ්ඩායම් ඉවත්ව ගිය අතර නීතිඥ සුනිල් වටගල ප්‍රකාශ කරන්නේ අදාළ චෝදනාව ව්‍යාජ එකක් බවයි.

මූලාශ්‍රය: www.facebook.com

05. ආණ්ඩුවට එරෙහි විරෝධතාවල ක්‍රියාකාරිකයකු වූ නීතිඥ ඉන්දික අත්තනායක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.

මොණරාගල ප්‍රදේශයේ සමාජ ක්‍රියාකාරිකයකු වන නීතිඥ අත්තනායක, අගෝ 31 වැනිදා ප්‍රශ්න කිරීම සඳහා කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා තිබූ අතර, එහිදී ආණ්ඩු විරෝධී විරෝධතා ව්‍යාපාරය හා පැවති සම්බන්ධතා පිළිබඳ ඔහුගෙන් ප්‍රශ්න කර තිබේ.

මූලාශ්‍රය: www.youtube.com

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 28ක් අගෝස්තු මාසය තුළ නිරීක්ෂණය විය. එයින් බොහොමයක් ජනාධිපතිවරයාට හා රජයට ඉල්ලා අස් වන ලෙස බල කරමින් පැන නැගුණු විරෝධතාවලට සම්බන්ධ ක්‍රියාකාරිකයින් අත්අඩංගුවට ගැනීමේ අවස්ථාවන්ය. අධිකරණ නියෝග කඩ කිරීම හා පොදු දේපළවලට හානි කිරීමේ චෝදනා මත අරගලයේ ක්‍රියාකාරිකයන් මර්දනය කිරීම සඳහා පොලිසිය අඛණ්ඩව කටයුතු කරමින් සිටින බව, නිරීක්ෂණයට ලක් වූ සිදුවීම් අනුව පැහැදිලිව පෙනෙන කරුණකි.**

**3 වගුව: 2022 අගෝස්තු: නීතිමය කොන්දේසි - සිදුවීම් 28**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 24 |
| නව නීති පැනවීම් | 01 |
| මාධ්‍ය නිදහසට ව්‍යවස්ථාමය ආරක්ෂාව | 03 |
| **එකතුව** | **28** |

01. ගෝල්ෆේස් අරගලයට (GGG) සම්බන්ධ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ විමුක්ති රණසිංහ අත්අඩංගුවට ගැනීම.

අගෝස්තු 2 වැනිදා ඔහු දෙමටගොඩ පිහිටි අපරාධ කොට්ඨාශය වෙත කැඳවා සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රශ්න කෙරුණු අතර 3 වැනිදා අලුයම, මහරගම පිහිටි ඔහුගේ නිවසේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගැනිණි. අගෝස්තු 5 වැනිදා කොළඹ අතිරේක මහේස්ත්‍රාත් කේමින්ද පෙරේරා හමුවට ඉදිරිපත් කිරීමෙන් පසු අගෝස්තු 12 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. අගෝස්තු 12 වැනිදා ඔහුට ඇප නියම වූ අතර අදාළ නඩු විභාගය නොවැම්බර් 24 දක්වා කල් තබන ලදි.

මූලාශ්‍රය: twitter.com

02. ගෝල්ෆේස් අරගලයට සම්බන්ධ ක්‍රියාකාරිකයකු වූ සිතුම් වසන්ත ජයකොඩි අත්අඩංගුවට ගැනීම.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අගෝස්තු 2 වැනිදා ඔහු අත්අඩංගුවට ගැනුණු අතර කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අගෝස්තු 5 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි.

මූලාශ්‍රය: www.facebook.com

03. ප්‍රමුඛ වෘත්තීය සමිති නායකයකු හා මානව හිමිකම් ආරක්ෂකයකු වූ ජෝසප් ස්ටාලින් අත්අඩංගුවට ගැනීම.

මැයි 28 වැනිදා පැවති විරෝධතා පා ගමනකට සහභාගී වීමෙන් 'උසාවි නියෝගයක් කඩ කළේය' යන චෝදනාව මත අගෝස්තු 3 වැනිදා ඔහු අත්අඩංගුවට ගත් අතර

කොළඹ කොටුව මහේස්ත්‍රාත් තිළිණ ගමගේ හමුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අගෝස්තු 12 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. අගෝස්තු 8 වැනිදා මෝසමක් මගින් නඩුව යළි කැඳවූ අවස්ථාවේ, රු. ලක්ෂ 5 බැගින් වූ ශරීර ඇප දෙකක් මත ඔහු මුදාහැරීමට අධිකරණය නියෝග කළේය.

මූලාශ්‍රය: lankadeepa.lk

04. **මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදරට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට කරුණු වාර්තා කිරීම.**

යූ ටියුබ් ඔස්සේ රජය විවේචනය කිරීම සම්බන්ධයෙන් ඔහුට එරෙහිව 22659/22 නඩු අංකය යටතේ අගෝස්තු 3 වැනිදා කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති අතර විමර්ශනයේ උද්‍යත නීතිපතිවරයා වෙත යවා ඇති බව දැනුම් දී තිබේ. මේ අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර විසින් මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කරන ලදි. (SC/FR/226/2022). තරිඳුට එරෙහිව නඩු පැවරීම ද්වේශසහගත තීරණයක් බව Digital Journalists Collective සාමූහිකය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: www.facebook.com

05. **ජනාධිපතිවරයා විසින් පනවා ඇති හදිසි නීති රෙගුලාසිවලට එරෙහිව ලිබරල් තරුණ ව්‍යාපාරය මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.**

එම ව්‍යාපාරය වෙනුවෙන් නීතිඥ නාමිණී පණ්ඩිත සහ රුසිරු එගොඩගේ විසින් ගොනු කර ඇති මෙම පෙත්සමෙන් කියා සිටින්නේ මෙම හදිසි නීති රෙගුලාසි හරහා, සාමකාමී සහ නිර්ප්‍රචණ්ඩ මහජන ඒකරාශීවීම් වැළැක්වීමට ජනාධිපතිවරයාට බලය හිමි වන අතර එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කොට ඇති භාෂණයේ නිදහසට සහ සාමකාමීව රැස්වීමේ නිදහසට බාධා වන බවයි. මෙම පෙත්සම සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල, එය විභාගයට ගැනීමට අගෝස්තු 12 වැනිදා තීරණය කළේය. පෙත්සම්කරුවන් වෙනුවෙන්, නීතිඥ ආචාර්ය ගෙහාන් ගුණතිලක පෙනී සිටියේය.

මූලාශ්‍රය: https://www.facebook.com

06. **ජාතික භික්ෂු පෙරමුණේ මාධ්‍ය ලේකම්, කොස්වත්තේ මහානාම හිමි අත්අඩංගුවට ගැනීම.**

ජූනි 9 වැනිදා පොලිස් මූලස්ථානය ඉදිරිපිට උද්ඝෝෂණයකට සහභාගී වීමෙන් අධිකරණ නියෝගයක් කඩ කළේය යන චෝදනාව මත කිරුළපන පොලිසිය අගෝස්තු 3 වැනිදා මහානාම හිමි අත්අඩංගුවට ගත් අතර, 4 වැනිදා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. 5 වැනිදා නඩුව යළි කැඳවූ අවස්ථාවේ රු. ලක්ෂ පහක ශරීර ඇප මත ඒ හිමියන් මුදාහැරීමට නියෝග කෙරිණි.

මූලාශ්‍රය: www.dinamina.lk

07. **ගෝල්ෆේස් අරගල භූමියේ රැඳී සිටින සියලු දෙනාට ඉන් ඉවත් වන ලෙස කොටුව පොලිසියේ ස්ථානාධිපතිවරයා දැනුම් දීම.**

අගෝස්තු 5 වැනිදා වන විට එම භූමියේ රැඳී සිටින සියලු දෙනා ඉවත් විය යුතු බවත් සිදු කර ඇති සියලු ඉදිකිරීම් හා වගා කටයුතු ඉවත් කර ගත යුතු බවත් අගෝස්තු 3 වැනිදා පොලිසිය ශබ්ද විකාශන යන්ත්‍ර මගින් දැනුම් දුන් අතර අරගලකරුවන් විසින් ඊට එරෙහිව අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කෙරිණි. එම පෙත්සම අගෝ 5 වැනිදා කැඳවූ අවස්ථාවේදී, අධිකරණ තීන්දුවක් ලැබෙන තුරු විරෝධතාකරුවන් හා ඉදිකිරීම් ඉවත් නොකරන බවට නීතිපතිවරයා එකඟ විය.

මූලාශ්‍රය: www.facebook.com

08. **සිරස මාධ්‍යවේදීන්ට පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමේ නිගමන හා නිර්දේශ ප්‍රකාශයට පත් කිරීම.**

ජූලි 9 වැනිදා රනිල් වික්‍රමසිංහගේ පෞද්ගලික නිවස අසලදී සිරස මාධ්‍යවේදීන්ට කළ පහරදීම, ඔවුන් මාධ්‍යවේදීන් ලෙස හඳුනාගැනීමෙන් පසුව හිතාමතාම කළ පහරදීමක් බවත් විශේෂ කාර්ය බලකායේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොමේෂ් ලියනගේ ඊට සෘජුවම වගකිවයුතු බවත් මානව හිමිකම් කොමිසම නිගමනය කර තිබේ. පරීක්ෂණ නිම වන තුරු අදාළ නිලධාරියා කොළඹින් පිට ප්‍රදේශයකට ස්ථාන මාරු කරන ලෙසත්, සිවිල් රාජකාරි සඳහා අනන්‍යතාව හඳුනාගත නොහැකි නිල ඇඳුම් නුසුදුසු වන අතර ඒ සඳහා සුදුසු නිල ඇඳුමක් ලබා දීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් කොමිසම පොලිස්පතිවරයාට නිර්දේශ කර ඇත.

මූලාශ්‍රය: www.themorning.lk

09. **ජනාධිපතිවරයාට එරෙහි උද්ඝෝෂණයකට සහභාගී වීම හේතුවෙන්, වෘත්තීය සමිති නායකයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

ලංකා බැංකු සේවක සංගමයේ ලේකම් ධනංජය සිරිවර්ධන සහ හිටපු සභාපති පාලිත ඇටම්පාවල, කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ පරීක්ෂණ ඒකකය මගින් අගෝ 4 වැනිදා අත්අඩංගුවට ගත් අතර අධිකරණයට ඉදිරිපත්

කිරීමෙන් පසු ඇප මත මුදාහැරිනි. ජූලි 9 වැනිදා උද්ඝෝෂණයේදී ජනාධිපති මන්දිරයට අනවසරයෙන් ඇතුළුවීම ඔවුන්ට එරෙහි චෝදනාවයි.

මූලාශ්‍රය: www.newswire.lk

10. **ජනාධිපති මන්දිරය අසල උද්ඝෝෂණයක නිරත වීම සම්බන්ධයෙන් හිටපු පා.ම. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු පිරිසක් අධිකරණයට ඉදිරිපත් කිරීම.**

අගෝස්තු 5 වැනිදා කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී මෙම නඩුව කැඳවූ අවස්ථාවේ, ජූලි 6 වැනිදා පැවති එම උද්ඝෝෂණය සම්බන්ධයෙන් පොලිසිය ගොනු කර ඇති චෝදනා වැරදිසහගත බවටත්, ඒ අනුව තම සේවාදායකයින් මෙම නඩුවේ සැකකරුවන් ලෙස නම් කළ නොහැකි බවටත් නීතිඥවරුන් ඉදිරිපත් කළ මූලික විරෝධතාව පිළිගත් මහේස්ත්‍රාත්වරයා, හිරුණිකා ඇතුළු පිරිස සැකකරුවන් ලෙස නම් කිරීම ප්‍රතික්ෂේප කළේය. අදාළ උද්ඝෝෂණයේ නිරතව සිටියදී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු 9 දෙනෙකු පොලිසිය මගින් අත්අඩංගුවට ගත් අතර පසුව පොලිස් ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: medialk.com

11. **නීතියට පටහැනි ලෙස පොලිස් ඇඳිරිනීතිය පැනවීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.**

නීතියේ ප්‍රතිපාදනවලින් බැහැරව ජූලි 8 වැනිදා පොලිස් ඇඳිරිනීතිය පැනවීමෙන් සිය මූලික අයිතිවාසිකම් කඩ වූ බවට ප්‍රකාශ කරනැයි ඉල්ලා, තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය නියෝජනය කරමින් තරිඳු ජයවර්ධන සහ තරිඳු උඩුවරගෙදර යන මාධ්‍යවේදීන් මෙම පෙත්සම ගොනු කර තිබේ. පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස පොලිස්පතිවරයා සහ නීතිපතිවරයා නම් කර ඇත.

මූලාශ්‍රය: theleader.lk

12. **උද්ඝෝෂණයකට අදාළ චෝදනා මත ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු වූ මංගල මද්දුමගේ අත්අඩංගුවට ගැනීම.**

අගෝස්තු 8 වැනිදා කොළඹ මහජන පුස්තකාලය අසලදී ත්‍රීරෝද රථයකින් පැමිණි සිවිල් ඇඳුමින් සැරසුණු පිරිසක් ඔහු පැහැරගෙන ගිය බව මුලින් වාර්තා වූ අතර පසුව පොලිසිය පැවසුවේ අධිකරණ නියෝග කඩ කිරීමේ චෝදනා මත ඔහු අත්අඩංගුවට ගත් බවයි. කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අගෝස්තු 12 වැනිදා දක්වාද, දෙවන වරට අගෝස්තු 24 වැනිදා දක්වාද ඔහු රක්ෂිත බන්ධනාගාරගත කෙරුණු අතර, අගෝස්තු 25 වැනිදා ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍ර: 1. ceylontoday.lk, 2. www.youtube.com

13. **ගෝල්ෆේස් අරගලයේ තරුණ ක්‍රියාකාරිකයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

'වෙනසක තාරුණ්‍යය' සාමාජික භානු ප්‍රභාෂණ සහ ගෝඨාගෝගම පුස්තකාලයේ ක්‍රියාකාරික සසිඳු තාරක යන දෙදෙනා අගෝස්තු 8 වැනිදා බම්බලපිටිය පොලිසිය වෙත කැඳවා තිබුණු අතර ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් පසු අත්අඩංගුවට ගැනිණි. පසුදින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කළ ඔවුන් දෙදෙනා ඇප මත මුදාහැරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

මූලාශ්‍රය: twitter.com

14. **උද්ඝෝෂණයක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝගයක් ඉල්ලා ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සමකට නීතිපතිවරයා විරෝධය පළ කිරීම.**

ගෝල්ෆේස් අරගලයේ ප්‍රමුඛ ක්‍රියාකාරිකයකු වූ ජීවන්ත පීරිස් පියතුමා විසින් ඉදිරිපත් කර තිබූ මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම අගෝස්තු 9 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලක් ඉදිරියේ සලකා බැලිණි. එහිදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයා සඳහන් කළේ අදාළ උද්ඝෝෂණයේදී සිදු කර ඇති වැරදි ගණනාවක් සම්බන්ධයෙන් ජීවන්ත පියතුමාට එරෙහිව පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කර ඇති බවයි. එහෙත් තම සේවාදායකයාට අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස කිසිදු දැනුම්දීමක් කර නොමැති බව ජීවන්ත පියතුමා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා පෙන්වා දුන්නේය. පෙත්සම සැප්තැම්බර් 1 වැනිදා යළි කැඳවීමට නියම කෙරිණි.

මේ අතර අගෝස්තු 12 වැනිදා සිය නීතිඥවරුන් මාර්ගයෙන් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වූ ජීවන්ත පීරිස් පියතුමා ඇප මත මුදාහැරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

මූලාශ්‍රය: www.runews.lk

15. **උද්ඝෝෂණයකට අදාළව සමාජ ක්‍රියාකාරිකයින් 8 දෙනෙකු අධිකරණයට ඉදිරිපත් කිරීම.**

පසුගිය මැයි මස 25 වැනිදා කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට පිවිසෙන මාර්ගය අසල පැවැත්වූ විරෝධතාවක් සම්බන්ධයෙන් අධිකරණය විසින් නිකුත්කළ නොතීසියකට අනුව සත්‍යවේල් පියතුමා, දමිතා අබේරත්න, රතිඳු සේනාරත්න, ජගත් මනුවර්ණ, ජෝසප් ස්ටාලින් ඇතුළු අට දෙනෙකු අගෝස්තු 9 වැනිදා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පෙනී සිටි අතර ඔවුන් ශරීර ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: dailymirror.lk

16. **උද්ඝෝෂණයක නිරත වූ සිසුන් 19 දෙනෙකු අත්අඩංගුවට ගැනීම හා සිසු නායකයින් තිදෙනෙකුට එරෙහිව රැඳවුම් නියෝග ලබා ගැනීම.**

අගෝස්තු 18 වැනිදා අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ උද්ඝෝෂණයක් අතරතුර 'අයුතු ජන රාශියකට' එක් වූ බවට චෝදනා කරමින් මෙම පිරිස අත්අඩංගුවට ගත් අතර පසුදා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඉන් 16 දෙනෙකු ඇප මත මුදාහැරිණි. අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ, හෂාන්ත ගුණතිලක සහ පූජ්‍ය ගල්වැව සිරිධම්ම හිමි යන තිදෙනා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 90ක කාලයක් රඳවා තබා ගැනීමට ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයා විසින් නියෝග කරන ලදි. ඒ, අදාළ රැඳවුම් නියෝගවලට අත්සන් නොකරන ලෙස එ.ජා. මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිත මේරි ලෝලර් ජනපතිගෙන් ඉල්ලා තිබියදීය.

මූලාශ්‍රය: www.bbc.com

17. **පැරිස් නුවර උද්ඝෝෂණවල ක්‍රියාකාරිකයකු වූ අර්ජුන අමදෝරු ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගැනීම.**

GotaGoHome විරෝධතා ව්‍යාපාරයට සහයෝගය පළකරමින් පැරිස් නුවර පැවති උද්ඝෝෂණවල ක්‍රියාකාරිකයකු වූ, ප්‍රංශයේ පදිංචිකරුවෙකු වන ඔහු, ශ්‍රී ලංකාවට ගොස් සිටියදී නිට්ටඹුව පොලීසිය විසින් අගෝස්තු 20 අත්අඩංගුවට ගැනිණි. අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු සැප්තැම්බර් මස 05 වැනිදා තෙක් රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි. පොලිසිය ප්‍රකාශ කරන්නේ ඔහු ජුනි 9 වැනිදා ශ්‍රී ලංකාවේ සිටි අතර එදින සිදු වූ ප්‍රචණ්ඩක්‍රියා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් බවයි.

මූලාශ්‍රය: dailymirror.lk

18. **සමාජ ක්‍රියාකාරික චින්තක රාජපක්ෂ අත්අඩංගුවට ගැනීම.**

MONLAR හි කැඳවුම්කරු වන ඔහු, විරෝධතාවයකට සහභාගී වී ආපසු යමින් සිටියදී අගෝ. 18 වැනිදා කොළඹදී අත්අඩංගුවට ගත් අතර, අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අගෝ 26 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. ජූලි මාසයේදී අරගලකරුවන් විසින් අත් කරගත් ජනාධිපති මන්දිරයේ පැවති මාධ්‍ය සාකච්ඡාවකට සහභාගී වීම ඔහුට එරෙහිව ඇති චෝදනාවයි. අගෝස්තු 26 වැනිදා ඔහුට ඇප නියම කෙරිණි.

මෙම අත්අඩංගුවට ගැනීමට එරෙහිව අගෝ. 23 වැනිදා සිවිල් සංවිධාන නියෝජිතයන් විසින් මානව හිමිකම් කොමසම වෙත පැමිණිලි කරන ලදි.

මූලාශ්‍රය: srilankabrief.org

19. **ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ සහජ මධුසංක ගාල්ලේදී අත්අඩංගුවට ගැනීම.**

අගෝස්තු 20 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ගාල්ලේදී ඔහු අත්අඩංගුවට ගත් අතර කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. අදාළ නඩුව සැප්තැම්බර් 7 වැනිදා යළි කැඳවීමට නියෝග කරන ලදි.

මූලාශ්‍රය: twitter.com

20. **ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ පියත් නිකේශල අත්අඩංගුවට ගැනීම.**

පොලිසිය මගින් කළ දැනුම් දීමකට අනුව අගෝස්තු 22 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටි ඔහු අත්අඩංගුවට ගෙන කොටුව මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කෙරුණු අතර, අගෝස්තු 26 දා තෙක් රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස නියෝග කෙරිණි. උද්ඝෝෂණවලට සහභාගී වීම සම්බන්ධ නඩු තුනක චූදිතයකු ලෙස ඔහු නම් කර තිබේ.

මූලාශ්‍රය: twitter.com

21. **සමාජවාදී ශිෂ්‍ය සංගමයේ නායක රංගන ලක්මාල් දේවප්‍රිය අත්අඩංගුවට ගැනීම.**

කොම්පඤ්ඤවීදිය පොලිසිය අසල සාමකාමී විරෝධතාවක නිරතව සිටියදී අගෝස්තු 22 වැනිදා අත්අඩංගුවට ගැනුණු ඔහු, 23 වැනිදා කොළඹ කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහරින ලදි.

මූලාශ්‍රය: lankaweb.lk

22. **අරගලයට සම්බන්ධ ප්‍රාසාංගික කලාකරුවකු වන ශාලික රුක්ෂාන් සේනාධීර අත්අඩංගුවට ගැනීම.**

කොළඹ වොක්ෂෝල් වීදියේදී අරගලයේ ක්‍රියාකාරිකයන් පිරිසක් අගෝස්තු 24 වැනිදා පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවකින් පසුව පොලිසිය ඔහු අත්අඩංගුවට ගත් අතර අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. මසකට පෙර පොලිස් මූලස්ථානය ඉදිරිපිට පැවැත්වූ උද්ඝෝෂණයකදී ඔහු ඉදිරිපත් කළ ප්‍රාසාංගික කලා අංගයක රංග වස්ත්‍රය පොලිස් නිල ඇඳුමට සමාන බවට පොලිසිය චෝදනා කරයි. 'තීර්ථ' ජාත්‍යන්තර කලාකරුවන්ගේ සාමූහිකය මේ පිළිබඳව නිවේදනයක් නිකුත් කරමින් අවධාරණය කළේ මෙම කලාකරු වහාම නිදහස් කළ යුතු බවයි.

මූලාශ්‍ර: 1. facebook.com
2. facebook.com

23. **අරගලයේ ක්‍රියාකාරිකයකු වූ සේනාධි ගුරුගේ අත්අඩංගුවට ගැනීම.**

'අරගලය ජාතික ව්‍යාපාරයේ' සම කැඳවුම්කරු වූ ඔහු අගෝස්තු 24 වැනිදා කොළඹ මධ්‍යම කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යාංශය මගින් අත්අඩංගුවට ගත් අතර පසුදා කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සැප්තැම්බර් 2 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. ගෝල්ෆේස් අරගල භූමියේදී යුද හමුදා බුද්ධි අංශ සාමාජිකයන් දෙදෙනෙකු බලහත්කාරයෙන් රඳවා තබා ගැනීමේ සිද්ධියක් සම්බන්ධයෙන් ඔහු සැකකරුවකු ලෙස නම් කර ඇත.

මූලාශ්‍රය: youtube.com

24. **ජනාධිපති කාර්යාලයේදී මාධ්‍ය හමුවක් ඇමතීම සම්බන්ධයෙන් ක්‍රියාකාරිකයින් පිරිසක් අධිකරණයට ඉදිරිපත් කිරීම.**

ජූලි 13 වැනිදා ජනාධිපති කාර්යාලයට බලහත්කාරයෙන් ඇතුළු වී මාධ්‍ය සාකච්ඡාවක් ඇමතීමේ චෝදනාව මත ජෝසප් ස්ටාලින්, ජීවන්ත පීරිස් පියතුමා, දුමින්ද නාගමුව, රංගන දේවප්‍රිය, මංගල මද්දුමගේ යන වෘත්තීය සමිති හා සමාජ ක්‍රියාධරයන් අගෝ 24 වැනිදා කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කෙරිණි. රු. ලක්ෂ 5 බැගින් වූ ශරීර ඇප මත ඔවුන් මුදාහැරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

මූලාශ්‍රය: dailynews.lk

25. **ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිනිය වූ මේරි සොනාලි පැවිදි සොහොයුරිය අධිකරණයට ඉදිරිපත් කිරීම.**

දෙමසකට පෙර, ජූනි 7 වැනිදා "ගිනි තැබීමේ" සිදුවීමක් පිළිබඳව විභාග කිරීමට අවශ්‍ය බව පවසා වෙන්නප්පුව පොලීසියට කැඳවන ලද මේරි සොනාලි පැවිදි සොයුරිය, 30 වැනිදා මාරවිල මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් වීමෙන් පසු ඇප මත මුදා හැරිණි.

මූලාශ්‍රය: twitter.com

26. **උද්ඝෝෂණයකදී ක්‍රියාකාරිකයින් 27 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

මර්දනයට එරෙහිව, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය විසින් අගෝස්තු 30 වැනිදා කැඳවන ලද උද්ඝෝෂණයේදී පිටකොටුව පොලිසිය මගින් අත්අඩංගුවට ගත් මෙම ක්‍රියාකාරිකයින් මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහැරීමට නියෝග කෙරිණි.

මූලාශ්‍රය: twitter.com

27. **කලා ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිකයකු හා වෘත්තීය නිර්මාණවේදියකු වන සංජය ඈපා සෙනෙවිරත්න අධිකරණයට ඉදිරිපත් කිරීම.**

මෑතකාලීන ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ ව්‍යාපාරයට සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව අගෝ 31 වැනිදා කුරුඳුවත්ත පොලිසිය වෙත කැඳවා ඔහුගෙන් ප්‍රශ්න කෙරුණු අතර අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: twitter.com

28. **අධිකරණයට ඉදිරිපත් වූ අරගලයේ ක්‍රියාකාරිකයින් දෙදෙනෙකුට ඇප නියම වීම.**

ජනාධිපති ලේකම් කාර්යාලයට අයුතු ලෙස ඇතුළු වීම සම්බන්ධයෙන් සැකකරුවන් ලෙස නම් කර ඇති සංක ජයසේකර සහ චමල් අකලංක යන ක්‍රියාකාරිකයන් අගෝස්තු 31 වැනිදා අධිකරණයට ඉදිරිපත් වූ අතර රු. ලක්ෂ පහ බැගින් වූ ශරීර ඇප මත මුදාහැරිණි. මෙම සිදුවීමට අදාළව මින් පෙර ක්‍රියාකාරිකයින් 16 දෙනෙකු අධිකරණයට ඉදිරිපත් කර තිබේ.

මූලාශ්‍රය: dinamina.lk

## ව්‍යුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන සිදුවීම් දෙකක් මෙහි ඇතුළත් වේ. නීතිමය කොන්දේසි යන සංරචකය යටතේ ඉදිරිපත් කර ඇති විශේෂ සිදුවීම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් ආරක්ෂකයින් හා විදෙස් රාජ්‍යතාන්ත්‍රිකයින් සිදු කළ මැදිහත්වීම් රැසක් මෙම දර්ශකයට අදාළ වුවද ප්‍රායෝගික තත්ත්වය අනුව ඒ සියල්ල මෙහි වෙනම සඳහන් කර නොමැත.**

**4 වගුව: 2022 අගෝස්තු: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 02**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 02 |
| **එකතුව** | **02** |

01. **සාමකාමී විරෝධතා මර්දනය කිරීම සඳහා හදිසි අවස්ථා රෙගුලාසි යොදා ගැනීම, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශේෂඥයින් හෙළා දැකීම.**

අගෝස්තු 8 වැනිදා නිකුත් කළ එම නිවේදනය මගින් වැඩිදුරටත් අවධාරණය කරන්නේ, හදිසි ක්‍රියාමාර්ග අවභාවිත කිරීම සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදීම රජයට සිය කනස්සල්ල පළ කළද ඉන් පලක් නොවූ බවයි. සාමකාමීව රැස්වීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය උල්ලංඝනය කිරීම සඳහා මෑතකදී හදිසි අවස්ථා රෙගුලාසි අඛණ්ඩව අපයෝජනය කිරීම හෙළා දකින බවද, එහි සඳහන් වේ.

මූලාශ්‍රය: ohchr.org

02. **විරෝධතාකරුවන්ට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීම ගැන හියුමන් රයිට්ස් වොච් සංවිධානය විරෝධය පළ කිරීම.**

සාමකාමී විරෝධතාකරුවන් ඉලක්ක කර කුරිරු ත්‍රස්ත මර්දන නීති භාවිත කිරීම වහා අවසන් කරන ලෙසත් අයිතිවාසිකම්වලට ගරු කරන ලෙසත් එම සංවිධානය ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා ඇතුළු රජයට තරයේ කියා සිටී. අගෝස්තු 18 වැනිදා පෙළපාලියකට සහභාගී වූ ශිෂ්‍ය ක්‍රියාකාරීන් තිදෙනෙකු, නඩු විභාගයකින් තොරව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ රඳවා ගැනීම ඇතුළුව මෑතකදී ගත් ක්‍රියාමාර්ග රැසක් සම්බන්ධයෙන් එම සංවිධානය විරෝධය පළ කර තිබේ.

මූලාශ්‍රය: hrw.org

## වෘත්තීයවේදීත්වය

**වෘත්තීයවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධිපත්‍යය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම යන දර්ශක ඇතුළත් වේ.**

**5 වගුව: 2022 අගෝස්තු: වෘත්තීයවේදීත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය | 01 |
| **එකතුව** | **01** |

01. **'අවදානම්සහගත වාර්තාකරණය, ජනමාධ්‍යවේදියෙකුගේ වගකීම, වගවීම සහ සීමා' මැයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විවෘත සංවාදයක් පැවැත්වීම.**

අගෝස්තු 23 වැනිදා zoom ඔස්සේ පැවැත්වුණු මෙම සංවාදයේ ප්‍රධාන අදහස් දැක්වීම මාධ්‍යවේදී අමල් ජයසිංහ සිදු කළ අතර තරිඳු උඩුවරගෙදර, ශාන්ත විජේසූරිය, අශාන්ති වර්ණසූරිය යන මාධ්‍යවේදීහුද අදහස් පළ කළහ. මාධ්‍යවේදී ශාන් විජේතුංග සංවාදය මෙහෙයවීය.

මූලාශ්‍රය: facebook.com

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි - අගෝස්තු දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි - ජූලි | | 2022 අගෝස්තු |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 45 | | 05 |
| නීතිමය කොන්දේසි | 54 | 19 | 28 |
| මාධ්‍යයේ ස්වාධීත්වය | 06 | | - |
| වෘත්තීයවේදීත්වය | 03 | | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 12 | 01 | 02 |
| **එකතුව** | **120** | **20** | **36** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-ජූලි මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.

**Free Media Movement**

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25